# කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

SARP

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

# ඇබෑර්තු

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (SARP), කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) සහ ශ්‍රී ලංකා රජය විසින් ඒකාබද්ධව අරමුදල් සපයන ව්‍යාපෘතියක් වන අතර, දේශගුණික විපර්යාසයන්ගෙන් පීඩාවට පත් අනුරාධපුර, වවුනියාව, මාතලේ, මන්නාරම, පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ග්‍රාමීය නිවාස 40,000 ක ඔරොත්තු දීමේ හැකියාව සහ වෙළඳපළ සහභාගීත්වය ගොඩනැගීම අරමුණු කරයි. ප්‍රධාන වැඩසටහන් නියෝජිතායතනය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය වන අතර, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU) සහ SARP ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාල දෙකක් (නිකවැරටිය සහ මැදවච්චිය) පිහිටා ඇත. සම්පූර්ණ ව්‍යාපෘති මූල්‍ය වටිනාකම USD 59.57 Mn වේ.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (බත්තරමුල්ල) සහ නිකවැරටිය ප්‍රාදේශීය සම්බන්ධිකරණ කාර්යාලයෙහි පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **ඉංජිනේරු (D කාණ්ඩය) - PMU හි තනතුරු 01**
2. **ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී (E කාණ්ඩය) - PLMU හි තනතුරු 03**
3. **ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) නිලධාරී (E කාණ්ඩය) - PMU හි තනතුරු 01**
4. **ජ්‍යෙෂ්ඨ අධීක්ෂණ සහ ඇගයීම් නිලධාරී (E කාණ්ඩය) - PMU හි තනතුරු 01**
5. **මූල්‍ය නිලධාරී (F කාණ්ඩය) - PMU හි තනතුරු 02**
6. **මූල්‍ය සහ පරිපාලන නිලධාරී (F කාණ්ඩය) - PMU හි සහ නිකවැරටිය HUB හි තනතුරු 02**
7. **ව්‍යාපෘති ලේකම් (F කාණ්ඩය) - PMU හි තනතුරු 01**
8. **විගණන සහකාර (MT 1 – 2025) - PMU හි තනතුරු 02**

**වැටුප් පරිමාණය සහ සුදුසුකම් :** කළමනාකරණ සේවා චක්‍රලේඛය අංක 01/2026 මත පදනම්ව

ඉහත සඳහන් තනතුර සඳහා පොදු කොන්දේසි අදාළ වේ

සියලුම සුදුසුකම් තනතුරේ අදාළ ක්ෂේත්‍රයේ විය යුතුය.

සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් (ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර ඇතුළුව) සහ අදාළ සියලුම සහතිකපත්වල පිටපත් ඉදිරිපත් කළ යුතුය. දැනට රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර ඇතුළුව ඔවුන්ගේ අයදුම්පත් සහ අදාළ සියලුම සහතිකපත්වල පිටපත් තම ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය. සියලුම අයදුම්පත් 2026.04.12 දින හෝ ඊට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද, යොමු කොන්දේසි (TOR) සහ අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර www.sarp.lk වෙත පිවිසෙන්න.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**

**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය, අංක. 2/2/1, කන්දවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල.**

**2026 මාර්තු 29**